# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2007 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්


| | | |
|---|---|---|
| | | පිටුව |
| 1. | 2007 අංක 12 දරන හර බදු (සංශෝධන) පනත | I |
| 2. | 2007 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත | I |
| 3. | 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | III |
| 4. | 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත | XIV |
| 5. | 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත | XV |
| 6. | 2007 අංක 33 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත | XV |

## 2007 අංක 12 දරන හර බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 11 වන දින]

**2002 අංක 16 දරන හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2007 අංක 12 දරන හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 16 දරන හර බදු පනතේ 5 වන වගන්තියේ, 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 14 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල, 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හැර, ඒ පනතේ කවර හෝ ස්ථානයක "වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක්" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ඒ වෙනුවට "වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක් හෝ මූල්‍ය සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන සහ 4 වන වගන්තිවල, 9 වන වගන්තියේ (1අ) උපවගන්තියේ, 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඉ) ඡේදවල සහ 13 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "වාණිජ බැංකුවක්" යන වචන වෙනුවට "වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධන කරනු ලැබේ :—

(1) "ජංගම ගිණුම" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "වාසික විදේශ මුදල් ගිණුමක්, විදේශීය ව්‍යවහාරික මුදල් බැංකු ඒකකයේ ගිණුමක් සහ කොටස් ආයෝජන සහිත බාහිර රුපියල් ගිණුමක්" යන වචන වෙනුවට "වාසික විදේශ මුදල් ගිණුමක්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයේ ගිණුමක්, ආයෝජන සහිත බාහිර රුපියල් ගිණුමක් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "ඉතිරි කිරීමේ ගිණුම" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක පවත්වාගෙන යන්නාවූ ද," යන වචන වෙනුවට "බලපත්‍රලත් වාණිජ බැංකුවක, බලපත්‍රලත් විශේෂිත බැංකුවක හෝ මූල්‍ය සමාගමක පවත්වාගෙන යන්නා වූ ද," යන වචන ආදේශ කිරීමෙන්.

5. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2007 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 11 වන දින]

**2006 අංක 11 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත සහ 2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2007 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## 2006 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම

2. 2006 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ (මෝටර් වාහන අනුග්‍රාහක බද්ද) 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය (ආ)(i) ඡේදය වශයෙන් නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (ආ)(i) වන ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් :—

(i) "(ආ)(i) "2000 අප්‍රේල් මස 1 වන දිනයෙන් "යන වචන වෙනුවට "2006 මාර්තු මස 31 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයෙන් අවසන් වන කාලය සඳහා, 2000 අප්‍රේල් මස 01 වන දිනයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එම උපවගන්තියෙහි "එසේ ආනයනය කරන අවස්ථාවේ දී "යන වචන වෙනුවට "එම තැනැත්තා ණයවර ලිපියක් විවෘත කිරීම මගින් ආනයනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අවස්ථාවක, එසේ ආනයනය කරන අවස්ථාවේ දී " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) නැවත අංක යෙදූ (ආ)(i) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ii) මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට සහ ඉන්පසුව, 2001 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භ වන අඛණ්ඩ තක්සේරු වර්ෂ පහක කාලසීමාව සඳහා ඉහත (i) වන ඡේදයේ සඳහන් අනුග්‍රාහක එම ඡේදය ප්‍රකාරව ලබාගෙන නොමැති සෑම තැනැත්තෙක් ම අවස්ථාවෝචිත පරිදි, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව එම එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් දෙලක්ෂ පණස් දහසකට (2,50,000/-) නොඅඩු මුදලක් ගෙවා ඇති සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බවට සහතික කර ඇති යම් තැනැත්තකු විසින් අවසරලත් මෝටර් වාහනයක් වශයෙන් ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි මෝටර් වාහනයක් ආනයනය කරනු ලබන විට, එම වාහනය ආනයනය කරනු ලබන අවස්ථාවේ දී, එම තැනැත්තා විසින් එම වාහන ආනයනය කිරීමේ දී (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සහ 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත ප්‍රකාරව එම තැනැත්තා ගෙවීමට යටත් වන යම් බද්දක හෝ මුල්‍ය වටිනාකමක මුළු එකතුව මත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ මත පදනම් ව මෙම කොටස යටතේ ගෙවිය යුතු බවට නියම කරනු ලැබේ."

(iii) මේ ඡේදයේ (i) වන සහ (ii) වන උපඡේදවල කාර්ය සඳහා, "මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනය" යන යෙදුමෙන් 2007 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනය අදහස් වේ.

(4) මේ උපවගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) අවුරුදු පහක කාලසීමාව ගණනය කිරීමේ දී එක්වරක් ගණන් ගනු ලැබූ යම් තක්සේරු වර්ෂයක් ඉන්පසුව අවුරුදු පහක කාලසීමාව ගණනය කිරීමේ දී සැලකිල්ලට නොගත යුතු ය.".

3. මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) (i) ඡේදයට මේ පනත මගින් කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා 2006 මාර්තු මස 31 වන දින සිට බලාත්මක වූ බවට සැලකිය යුතු ය.

## II වන කොටස

## 2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටස සංශෝධනය කිරීම

4. 2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටස (ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්ද) පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම කොටසේ 14 වන වගන්තියේ "(මෙහි මින් මතු "අයි.සී.ටී.ඒ.ඩී" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනයට" යන වචන වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එම කොටසේ 15 වන වගන්තියේ—

(අ) "අයි.සී.ටී.ඒ.ඩී." යන වචන වෙනුවට "දේශීය අදායම් කොමසාරිස් ජනරාල්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ පැති සටහනෙහි ඇති "අයි.සී.ටී.ඒ.ඩී." යන වචනය වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්" යන වචනය ආදේශ කිරීමෙන් ".

(3) එම කොටසේ 17 වන වගන්තියේ "අයි.සී.ටී.ඒ.ඩී." යන වචනය වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් " යන වචන ආදේශ කිරීමෙන්.

(4) එම කොටසේ 18 වන වගන්තියේ "අයි.සී.ටී.ඒ.ඩී." යන වචන වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්" යන වචනය ආදේශ කිරීමෙන් .

(5) එම කොටසේ 19 වන වගන්තියේ (2), (3), (4), (5) සහ (6) යන උපවගන්තිවල "අයි.සී.ටී.ඒ.ඩී." යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්" යන වචන ආදේශ කිරීමෙන්.

(6) එහි 20 වන වගන්තියේ—

(අ) "ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්" යන්නට, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය. ; තව ද

(ආ) ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය "අයි.සී.ටී.ඒ.ඩී." යන්නෙහි අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්.

(7) එහි 22 වන වගන්තිය අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"මේ වගන්තියේ කාර්ය සඳහා "අයි.සී.ටී.ඒ.ඩී." යන්නෙන් 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ 1992 ජුනි 10 වන දින අංක 718/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් සංස්ථාපනය කොට පිහිටුවනු ලැබූ කාර්මික ආයතනයක් වන ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය අදහස් වේ.".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 09 වන දින]

**පරිගණක අපරාධ හඳුනාගැනීම පිණිස සහ එවැනි අපරාධ විමර්ශනය කිරීම සහ වැළැක්වීම සඳහා නෛතික ක්‍රියාමාර්ගයන් සැලසීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) (අ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත සිටින අතරතුර දී යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී ;

(ආ) මේ පනත යටතේ වරදක් වශයෙන් සමන්විත වන ක්‍රියාවක් හේතුවෙන් හානියට පත් කළ හෝ හානියට පත්වන්නට තිබුනා වූ, පරිගණක, පරිගණක වැඩ සටහන, තොරතුරු අදාළ කාලය තුළ දී ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත තිබූ අවස්ථාවක දී ;

(ඇ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා භාවිත කරන ලද යම් පරිගණක ආචයන හෝ දත්ත හෝ සන්නිවේදන පහසුකම ඇතුළු පරිගණක පහසුකම හෝ සේවය අදාළ කාලය තුළ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් ස්ථානයක පාද මූලික වී තිබුන අවස්ථාවක දී ; හෝ

(ඈ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම මගින්, රජයට හෝ ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පදිංචි යම් තැනැත්තකුට පාඩුවක් හෝ අලාභයක් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිදු කරන අවස්ථාවක දී,

මේ පනතේ විධිවිධාන අදාළ කර ගත යුතු ය.

(2) (1) වන උප වගන්තියේ (ඈ) ඡේදයේ කාර්යය සඳහා තැනැත්තකු යන්නට සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

## I වන කොටස

## පරිගණක අපරාධ

3. කිසියම් තැනැත්තකු විසින්, හිතාමතාම තමා උදෙසා හෝ වෙනත් යම් තැනැත්තකු උදෙසා —

(අ) යම් පරිගණකයකට ; හෝ

(ආ) යම් පරිගණකයක් තුළ ගබඩා කර තිබෙන යම් තොරතුරුවලට ප්‍රවේශය අත්කර ගැනීමේ අරමුණින්, ඒ ප්‍රවේශය අත්කර ගැනීමට ඔහුට නීත්‍යානුකූල බලයක් නොමැති බවට දැනුවත්ව හෝ එසේ විශ්වාස කිරීමට කරුණු තිබිය දී, යම් ක්‍රියාවක් සිදු කරනු ලබයි නම්, ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

4. කිසියම් තැනැත්තකු විසින්, හිතාමතාම තමා උදෙසා හෝ වෙනත් යම් තැනැත්තකු උදෙසා —

(අ) යම් පරිගණකයකට ; හෝ

(ආ) යම් පරිගණකයක් තුළ ගබඩා කර තිබෙන යම් තොරතුරුවලට,

ප්‍රවේශය අත්කර ගැනීමේ අරමුණින්, ඒ ප්‍රවේශය අත්කර ගැනීමට ඔහුට නීත්‍යානුකූල බලයක් නොමැති බවට දැනුවත්ව හෝ එසේ විශ්වාස කිරීමට කරුණු තිබිය දී සහ මේ පනත යටතේ වෙනත් වරදක් හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ යම් වරදක් සිදු කිරීමේ අදහසින් යම් ක්‍රියාවක් සිදු කරනු ලබයි නම් ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

පැහැදිලි කිරීම 1- (අ) ඡේදයේ කාර්යය සඳහා පරිගණකයක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම පමණක් ප්‍රමාණවත් වේ.

පැහැදිලි කිරීම 2- (ආ) ඡේදයේ කාර්යය සඳහා—

(අ) යම් පරිගණකයක ඇති යම් වැඩ සටහනක් හෝ දත්තයක් ලබා ගැනීමට චේතනාවක් තිබිය යුතු ය.

(ආ) ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රවේශය අවසර නොමැතිව විය යුතු ය.

(ඇ) ප්‍රවේශය යම් විශේෂිත වැඩසටහනක්, දත්ත හෝ පරිගණකයක් කෙරෙහි යොමු වීම අවශ්‍ය නැත.

5. පරිගණකයකට යම් කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීම සඳහා තමාට අධිකාරි බලයක් නොමැති බව දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට කරුණු ඇතිව හිතාමතාම, යම් පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට අනවසර වෙනස් කිරීමක් හෝ අලාභයක් හෝ අලාභයක් සිදුවිය හැකි යම් ක්‍රියාවක් හෝ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන්ලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

*පැහැදිලි කිරීම්*

යම් පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට හෝ පරිගණක වැඩසටහනකට යම් අනවසර වෙනස් කිරීමක්, අලාභයක් හෝ අලාභයක් සිදුවිය හැකි යම් ක්‍රියාවක් කිරීම සඳහා පහත සඳහන් කරුණු වලින් එක් කරුණක් හෝ සිදු විය හැකි ය.

(අ) යම් පරිගණකයකට, පරිගණක පද්ධතියකට හෝ යම් පරිගණකයක ඇති දත්තවල හෝ තොරතුරුවල විශ්වාස-නීයත්වයට හානියක් සිදු කිරීම ;

(ආ) යම් පරිගණකයක ඇති යම් තොරතුරක් විනාශ කිරීම, මකා දැමීම, විකෘති කිරීම හෝ එකතු කිරීම හෝ ස්ථානය වෙනස් කිරීම හෝ වෙනස් කිරීම ;

(ඇ) දත්ත තැන්පත් කිරීම හෝ ඉවත් කිරීම සඳහා පරිගණක වේලාව සහ දත්ත සැකසුම් අඩංගු පරිගණක සේවයක් භාවිත කිරීම ; හෝ

(ඈ) පරිගණකයක් ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමට හෝ කිසියම් පරිගණකයක හෝ පරිගණක පද්ධතියකට අයිති දත්ත හෝ යම් තොරතුරු වංචා කිරීමට බලපෑමක් කිරීමට හැකි පරිගණක වැඩසටහනක් හඳුන්වාදීම.

පැහැදිලි කිරීම-ඉහත (අ) සිට (ඈ) දක්වා වූ ඡේදවල කාර්ය සඳහා එහි සඳහන් ආනුෂංගයක් තාවකාලික හෝ ස්ථිර ස්වභාවයේ ඒවා ද යන්න වැදගත් නොවේ.

6. (1) යම් පරිගණකයකට හිතාමතාම යම් කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීමෙන් සහ එයින් යම් හානියක් වන බව දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට කරුණු ඇතිව එයින් —

(අ) ජාතික ආරක්ෂාවට ;

(ආ) ජාතික ආර්ථිකයට ; හෝ

(ඇ) මහජන ආරක්ෂාවට,

හානි සිදු කිරීම හෝ ආසන්නම හානියක් සිදු කිරීමට සලස්වන්නා වූ යම් තැනැත්තකුට අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුත් සහතිකයකින් (1) වන උපවගන්තියේ (අ) හෝ (ඇ) ඡේද යටතේ වූ වරදක් සඳහා වන නඩු පැවරීමක දී හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුත් සහතිකයකින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ වරදක් සඳහා නඩු පැවරීමක දී පිළිවෙලින් ප්‍රකාශිත (1) වන උපවගන්තියේ මුහුණපාන ලද අවස්ථාවන් අවස්ථාවෝචිත පරිදි ජාතික ආරක්ෂාවට හෝ රජයේ නියමයකට හෝ ජාතික ආර්ථිකයට අදාළව පවත්නා බව සත්‍ය වශයෙන් විද්‍යමාන විය යුතු ය. එවැනි සෑම සහතිකයක්ම සාක්ෂි වශයෙන් අදාළ කර ගත යුතු අතර, මුල් බැල්මට එහි දැක්වෙන කරුණු පිළිගත හැකි සාක්ෂි විය යුතු ය.

7. වෙනත් යම් තැනැත්තකු විසින් නීත්‍යානුකූල අවසරයකින් තොරව පරිගණකයකින් හෝ පරිගණක ආචයන මාධ්‍යයකින් තොරතුරු ලබාගෙන ඇති බවට දැනුවත්ව හෝ එසේ විශ්වාස කිරීමට හේතු තිබිය දී, එවැනි යම් තොරතුරු —

(අ) මිලට ගැනීම, ලබා ගැනීම, රඳවා ගැනීම, විකිණීම හෝ මිනැම ආකාරයකින් කටයුතු කරන ;

(ආ) මිලට ගැනීමට හෝ විකිණීමට ඉදිරිපත් කරන හෝ මිනැම ආකාරයකින් ගණුදෙනු කරන ;

(ඇ) එක් ආචයන උපක්‍රමයකින් වෙනත් එකකට මාරු කරන, විශාල ආචයන උපක්‍රමයකට මාරුකරන, පිටපත් කරන හෝ භාවාර්ථයන් හෝ තේරුම් කර ගන්නා,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොඅඩු සහ ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

*පැහැදිලි කිරීම*.– 9 සහ 10 වගන්තිවල කාර්ය සඳහා —

(අ) වරදකරුට පරිගණකයට ප්‍රවේශ වීමට අධිකාරී බලය තිබීම හෝ කර්තව්‍යයන් ඉටු කිරීමට අධිකාරී බලය තිබීම වැදගත් නොවේ ;

(ආ) වරදකරු විසින් යම් විශේෂිත තැනැත්තකුට හෝ ආයතනයකට හානියක් හෝ පාඩුවක් හෝ අලාභයක් සිදු කිරීමට අරමුණු කර තිබීම හෝ ඔහු විසින් එසේ යම් විශේෂිත තැනැත්තකුට හෝ ආයතනයකට හානියක් හෝ පාඩුවක් හෝ අලාභයක් සිදු විය හැකි බව දැනුවත්ව සිටීම අවශ්‍ය නොවේ.

8. (අ) පරිගණකයක් හෝ පරිගණකයක් විසින් හෝ පරිගණකයක් තුළ හෝ සිදු කරන, හුවමාරු වන දත්ත හෝ සේවා දායක තොරතුරු ; හෝ

(ආ) පරිගණකයකින් යම් තොරතුරු ගෙන යන විද්‍යුත් චුම්භක විමෝචන,

යම් තාක්ෂණික විධි ක්‍රම මගින් දැනුවත්ව හෝ නීත්‍යානුකූල අවසරයක් නොමැතිව අත්කර ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

9. යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීම සඳහා භාවිත කරවීමේ අදහසින් —

(අ) පරිගණක හෝ පරිගණක වැඩසටහන් ඇතුළුව යම් පරිගණක උපක්‍රමයක් ;

(ආ) පරිගණකයට හෝ එහි යම් කොටසකට ප්‍රවේශවීමේ හැකියාව පවතින පරිගණක මුරපදයක්, ප්‍රවේශ කේතයක් හෝ ඒ හා සමාන දත්ත,

නීත්‍යානුකූල අවසරයක් නොමැතිව භාවිතය සඳහා ඉදිරිපත් කරන, විකුණන, නිෂ්පාදනය කරන, ආනයනය කරන, අපනයනය කරන, බෙදාහරින හෝ අන්‍යාකාරයකින් සපයා දෙන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

10. පරිගණකයක් මාර්ගයෙන් සපයනු ලබන යම් සේවාවකට ප්‍රවේශවීමට හැකිකරවමින් තමාට පවරා දෙනු ලැබූ තොරතුරු, යම් ප්‍රකාශිත අධිකාරී බලයක් නොමැතිව හෝ යම් ප්‍රකාශිත හෝ ව්‍යංජිත ගිවිසුමක් කඩකරමින් හෝ අනාවරණය කරන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

11. මේ පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන සහ 14 වන වගන්තිවල සඳහන් වැරදි වලින් කිසිවක් සිදු කිරීමට තැත් කරන හෝ එවැනි වරදක් සිදුකරනු ලැබීමට සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ විට එක් එක් වරද සඳහා නියම කරන ලද උපරිම දඩයෙන් හරි අඩකට නොවැඩි දඩයකට හෝ එක් එක් වරද සඳහා, නියම කරන ලද උපරිම කාලයෙන් හරි අඩකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

12. (1) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට අනුබල දෙන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට —

(අ) අනුබල දීමේ ප්‍රතිඵලයක් ලෙස අනුබල දුන් වරද සිදු කරනු ලැබ ඇත්නම්, ඒ වරද සඳහා පනවා ඇති දඬුවමට යටත් විය යුතු ය ; තව ද

(ආ) අනුබල දීමේ ප්‍රතිඵලයක් ලෙස වරද සිදුකර නොමැති අවස්ථාවක —

(i) වරද සඳහා උපරිම දඩයක් හෝ බන්ධනාගාරගත කිරීමක් පනවා ඇති අවස්ථාවක, වරද සඳහා පනවන ලද උපරිම දඩයෙන් හතරෙන් එකකට නොවැඩි දඩයකට හෝ වරද සඳහා පනවන ලද උපරිම කාලසීමාවෙන් හතරෙන් එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය ; සහ

(ii) වරද සඳහා උපරිම දඩයක් හෝ බන්ධනාගාරගත කිරීමක් පනවා නොමැති අවස්ථාවක දී හෝ බන්ධනාගාරගත කිරීමේ උපරිම කාල සීමාව ජීවිතාන්තය දක්වා වූ බන්ධනාගාරගත කිරීමක් වන අවස්ථාවක දී, රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) "අනුබල දීම" යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන අධිකාරය) 100 වන සහ 101 වන වගන්තිවලින් දී ඇති අර්ථකථනය අදාළ වන අතර, දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන අධිකාරය) 101අ, 103 වන, 104 වන, 105 වන, 106 වන සහ 107 වන වගන්තිවල විධිවිධාන මේ පනත යටතේ යම් වරදකට අනුබලදීම සම්බන්ධයෙන් ද අදාළ කරගනු ලැබිය යුතු ය.

13. (1) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට ඒ වරද සිදු කිරීමට අනුබල දීම සඳහා නියමිත දඬුවමින් දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) "කුමන්ත්‍රණය " යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන අධිකාරය) 113අ වගන්තියේ (2) වන උපවගන්තියේ දී ඇති අර්ථකථනය අදාළ කරගත යුතු අතර, ඒ වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

14. (1) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට සහ ඒ වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස —

(අ) යම් තැනැත්තකුට හෝ ආයතනයකට පාඩුවක් හෝ අලාභයක් සිදුවන ; හෝ

(ආ) වරදකරුට හෝ වෙනත් යම් තැනැත්තකුට මුදල් ලාභයක් උපචිත වන,

අවස්ථාවක දී අධිකරණය විසින් වරදකරු වෙත පනවනු ලබන යම් දඬුවමකට අමතරව, වරදකරුට, අවස්ථාවෝචිත පරිදි —

(i) ඒ පාඩු හෝ අලාභ සිදු වූ තැනැත්තාට හෝ ආයතනයට වන්දියක් ; හෝ
(ii) එසේ උපචිත වූ මුදල් ලාභයේ වටිනාකමට සමාන මුදලක් රජයට,

ගෙවීමට නියෝගයක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවීම සඳහා කරනු ලබන නියෝගයක් ඒ නියෝගය අවස්ථාවෝචිත පරිදි පාඩුවෙන් හෝ අලාභයෙන් පීඩාවට පත් වූ තැනැත්තාට හෝ ආයතනයට හෝ රජයට වාසි වන පරිදි දිසා අධිකරණය මගින් දෙන ලද ආඥාව පරිදි, බලාත්මක කරනු ලැබිය යුතු ය.

(3) සිදු කරනු ලැබූ පාඩුවට හෝ අලාභයට හෝ උපචිත ලාභයේ මුදල් වටිනාකමේ ප්‍රමාණයට සමානුපාතික වන වන්දි ප්‍රමාණයක් වශයෙන් විශේෂඥයකුගේ අත්සනින් යුතු සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගත හැකි අතර, ඊට පටහැනි බව ඔප්පු කරන තෙක් එහි ප්‍රකාශිත කරුණු මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයකින්, කිසියම් තැනැත්තකුට හෝ ආයතනයකට වන්දි ගෙවීමක දී ඒ නියෝගය යටතේ ගෙවනු ලැබූ වන්දි ප්‍රමාණය ඉක්මවා සිවිල් ප්‍රතිකර්මයකින් අලාභ අය කර ගැනීම සඳහා ඒ තැනැත්තාට හෝ ආයතනයට ඇති අයිතිය වැළැක්වීම හෝ අගතියට පත් කිරීම නොකළ යුතු ය :

එසේ වුව ද, එකී සිවිල් ප්‍රතිකර්මයට අදාළව කිසියම් නඩු කටයුත්තක් ආරම්භ කිරීම සඳහා කාලාවරෝධ ආඥාපනතේ (68 වන අධිකාරය) නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව ගණනය කළ යුත්තේ (1) වන උපවගන්තිය යටතේ එකී නියෝගය කරන ලද දින සිට ය.

## II වන කොටස

## විමර්ශන

15. මේ පනතින් අන්‍යාකාරයකින් සලස්වා ඇති විධිවිධාන හැර, මේ පනත යටතේ වන සියලු වැරදි විමර්ශනය කිරීම, විභාග කිරීම හෝ අන්‍යාකාරයකින් සුදුස්සක් කිරීම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

16. මේ පනත යටතේ වන සෑම වරදක්ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා, සංඥේය වරදක් විය යුතු ය.

17. (1) මේ පනත යටතේ වූ වරදක් සඳහා කිසියම් විමර්ශනයක් පැවැත්වීමේ දී යම් පොලිස් නිලධරයකුට සහාය වීම සඳහා (මෙහි මින් මතු "විශේෂඥයා" යනුවෙන් හඳුන්වනු ලබන) විද්‍යුත් ඉංජිනේරු ශිල්පයේ හෝ මෘදුකාංග තාක්ෂණ ශිල්පයේ නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද දරන යම් රජයේ නිලධරයකු, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විමසා විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "විශේෂඥයා" යන්නට —

(අ) නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද දරන අදාළ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරන ලද යම් විශ්ව විද්‍යාලයක කාර්යය මණ්ඩලයේ කිසියම් සාමාජිකයකු ;

(ආ) නියමිත සුදුසුකම් දරන්නේ යයි අදාළ විශ්ව විද්‍යාලයට හැඟීයන්නා වූ සහ ඒ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරන ලද ආයතනයක් ;
එසේ වුව ද, ඉහත (අ) සහ (ආ) යටතේ විශේෂඥයකු හඳුනා ගැනීමට නොහැකි වූ අවස්ථාවක අදාළ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියමිත සුදුසුකම් දරන වෙනත් යම් ආයතනයක් ;

ඇතුළත් වේ.

(ඇ) "විශ්ව විද්‍යාලය" යන්නට, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් විශ්ව විද්‍යාලයක් අදහස් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විශේෂඥයකුට අවශ්‍ය කරන සුදුසුකම් සහ පළපුරුද්ද (විද්‍යුත් ඉංජිනේරු ශිල්පයේ හෝ මෘදුකාංග තාක්ෂණ ශිල්පයේ විශේෂිත ක්ෂේත්‍රවල සැලකිල්ලට ගෙන) ඔවුන් පත්කිරීමේ ක්‍රමය සහ ආකාරය සහ ඒ විශේෂඥයන් පත්කිරීමේ කොන්දේසි නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) මේ පනත යටතේ වූ විමර්ශනයක කාර්ය සඳහා යම් පොලිස් නිලධරයකු සහාය වීමට කැඳවනු ලැබූ විශේෂඥයකුට —

(අ) උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක පොලිස් නිලධරයකු සමග යම් පරිශ්‍රයකට ඇතුළුවීම සඳහා ;

(ආ) කිසියම් කර්තව්‍යයක් ඉටුකිරීමට හෝ එවැනි වෙනත් යම් දෙයක් සිදු කිරීම සඳහා යම් තොරතුරු පද්ධතියකට පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට හෝ එවැනි පරිගණකයක ඇති යම් වැඩසටහනකට, දත්තවලට හෝ තොරතුරුවලට ප්‍රවේශවීම සඳහා ;

(ඇ) හුවමාරු කරනු ලැබූ යම් දත්තයක් හෙළිකරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම සඳහා ;

(ඈ) යම් තැනැත්තකුගෙන් වාචිකව ප්‍රශ්න කිරීම සඳහා ;

(ඉ) මේ පනතේ කාර්යයක් සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන වෙනත් යම් සියලු දේ ඉටු කිරීම සඳහා,

බලය තිබිය යුතු ය.

(5) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් විශේෂඥයකුට ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීමේ දී යම් පොලිස් නිලධරයකුට සහායවීම සඳහා විශේෂඥයකු කැඳවනු ලැබිය හැකි අතර, එම විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි යම් සියලු සහාය ලබාදීම පත්කරන ලද එම විශේෂඥයාගේ කාර්යය විය යුතු ය. විමර්ශනයේ තීරණවල ප්‍රතිඵලයක් ලෙස යම් නීති කෘත්‍යයක් ආරම්භ වී ඇති අවස්ථාවක, ඒ විමර්ශන ක්‍රියාවලියේ දී තමා විසින් ලබා ගත හැකි යම් තොරතුරු, දත්ත, කරුණු හෝ වෙනත් කාරණා එම කෘත්‍යයේ කාර්ය සඳහා ලබාදීම පත් කළ එම විශේෂඥයාගේ කාර්යය විය යුතු ය.

18. (1) මේ පනත යටතේ වන විමර්ශන කාර්යයන් සඳහා විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින්, මහේස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරන අධිකාරි පත්‍රයක් මත වූ බලයක් යටතේ, ඒ සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් මත —

(i) සේවා සැපයුම්කරුවකුගෙන් සේවාදායක තොරතුරු සහ හුවමාරුවන දත්ත ඇතුළුව මිනැම තොරතුරක් ලබා ගැනීම ;

(ii) සේවාදායක තොරතුරු සහ හුවමාරුවන දත්ත ද ඇතුළත් යම් විදුලි හෝ ඉලෙක්ට්‍රොනික සංදේශයක මිනැම අවස්ථාවක දී අතරමග බාධා පැමිණවීම් හෝ ඒවා අත්පත් කර ගැනීම,

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින් අධිකාරි පත්‍රයක් නොමැති වුව ද, ඒ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති බලතල සියල්ල හෝ ඉන් කිසිවක් —

(අ) පවත්වනු ලැබීමට අවශ්‍ය විමර්ශනයේ හදිසි භාවය ; සහ

(ආ) සාක්ෂි නැතිවිය හැකි හෝ විනාශ විය හැකි, වෙනස් කළ හැකි හෝ සාක්ෂිවලට ප්‍රවේශය අහිමි විය හැකි බව ; හෝ

(ඇ) විමර්ශනය සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව,

යන අවස්ථාගත කරුණු යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ වූ වරදක් සඳහා තැනැත්තකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 36, 37 සහ 38 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) මේ පනත යටතේ කිසියම් විමර්ශන කාර්ය සඳහා හුවමාරුවන දත්ත ඇතුළුව, දත්ත සහ තොරතුරු වැළැක්වීම සහ ඒවාට බාධා කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබීමට අවශ්‍ය ක්‍රම සහ ක්‍රියාමාර්ග අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

19. (1) මේ පනත යටතේ වූ යම් විමර්ශන කාර්යයක් සඳහා පරිගණකයක් තුළ ගබඩා කරන ලද කිසියම් තොරතුරක් යුක්ති සහගතව අවශ්‍ය යයි සහ එකී තොරතුරු අහිමිවිය හැකි බවට, විනාශ විය හැකි බවට, වෙනස් කළ හැකි බවට හෝ ප්‍රවේශ විය නොහැකි ලෙසට පත් කළ හැකි බවට අවදානමක් පවතින බවට යම් විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු සෑහීමට පත්වන අවස්ථාවක දී ඒ විශේෂඥයා හෝ පොලිස් නිලධරයා විසින්, එකී පරිගණකයේ හෝ පරිගණක පද්ධතියේ පාලකයාට ලිඛිත දැන්වීමකින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කෙරෙන දින හතක් (7) නොඉක්මවන කාලයක් සඳහා එම තොරතුරු සුරක්ෂිත කළ යුතු බවට නියම කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණ බලය පවතින මහේස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ඉල්ලීමක් මත, තොරතුරු සුරක්ෂිත කරනු ලැබිය යුතු කාලසීමාව තවදුරටත් දින අනූවකට නොවැඩි කාල සීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

20. විමර්ශන ක්‍රියාවලියක දී යම් සෝදිසි කිරීමක් හෝ පරීක්ෂා කිරීමක් මෙහෙයවන හෝ වෙනත් යම් දෙයක් සිදු කරන සෑම පොලිස් නිලධරයකු සහ සෑම විශේෂඥයකු විසින්, යම් පරිගණකයක් හෝ පරිගණක පද්ධතියක් හෝ එහි කොටසක භාවිත කරනු ලැබිය හැකි සාමාන්‍ය නීත්‍යානුකූල එදිනෙදා කටයුතුවලට එවැනි සෝදිසි කිරීම්, පරීක්ෂා කිරීම් හෝ විමර්ශන වලින් අවහිර නොවීම සහතික කිරීම සඳහා වන සියලු උත්සාහයන් ගනු ලැබිය යුතු අතර —

(අ) ඒ පරිගණකය හෝ පරිගණක පද්ධතිය එහි කොටස පිහිටා තිබෙන පරිශ්‍රයේ දී පරීක්ෂා කිරීම් මෙහෙයවීමට නොහැකිව ඇත්නම් ; හෝ

(ආ) පරිගණකය හෝ පරිගණක පද්ධතිය හෝ එහි කොටස තහනමට ගැනීම වරදක් සිදුකිරීම වැළැක්වීමට හෝ වරදක් දිගටම කරගෙනයාම වැළැක්වීමට හෝ එසේ නොකළහොත් අහිමි වන්නා වූ, විනාශ වන්නා වූ, වෙනස් වන්නා වූ හෝ ප්‍රවේශ විය නොහැකි ලෙසට පත්වන්නා වූ යම් තොරතුරුවල සන්තකය ලබා ගැනීමට හෝ අත්‍යවශ්‍ය වන අවස්ථාවල දී ;

හැර, එකී තහනමට ගැනීම ඒ පරිගණකය භාවිත කරනු ලබන සාමාන්‍ය එදිනෙදා කටයුතු මෙහෙයවීමට හානිකර වේ නම්, යම් පරිගණකයක් හෝ පරිගණක පද්ධතිය හෝ එහි කොටසක් තහනමට ගැනීම නොකළ යුතු ය.

21. (1) මේ පනත යටතේ විමර්ශන ක්‍රියාවලියක දී යම් පොලිස් නිලධරයකු විසින් නීතියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට අත්අඩංගුවට ගැනීමේ, සෝදිසි කිරීමේ හෝ තොරතුරු තහනමට ගැනීමේ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ පනත යටතේ වරදක් සිදුකරන ලදැයි සැක කරනු ලබන යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගන්නා වූ පොලිස් නිලධරයකු විසින්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ ඒ අත්අඩංගුවට ගැනීම සිදු කළ ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට ගතවන කාලය අතහැර ඒ තැනැත්තා අත්අඩංගුවට ගත් වේලාවේ සිට පැය විසිහතරක කාලයක් ඇතුළත සැකකරු අත්අඩංගුවට ගත් ස්ථානයට ආසන්නම මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් පොලිස් නිලධරයකු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ කුසලතාවක් දරන බවට සහ එහෙයින් එවැනි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රවීනත්වය ලබා ඇති බවට පොලිස්පතිවරයා විසින් ලිඛිතව සහතික කරනු ලැබ ඇත්නම් මිස, කිසිදු පොලිස් නිලධරයකු මේ පනත යටතේ වන විමර්ශන කාර්ය සඳහා යම් පරිගණකයකට ප්‍රවේශ නොවිය යුතු ය.

22. (1) විමර්ශන ක්‍රියාවලියක දී යම් අයිතම හෝ දත්ත තහනමට ගෙන ඇති හෝ ප්‍රවේශය තහනම් කර ඇති අවස්ථාවක දී, ඒ සෝදිසි කිරීම මෙහෙයවන පොලිස් නිලධරයා විසින්, එකී තහනමට ගත් හෝ ප්‍රවේශය තහනම් කළ දිනය හා වේලාව ඇතුළුව එකී අයිතම හා දත්තවල සම්පූර්ණ ලැයිස්තුවක් එකී පරිගණකයේ අයිතිකරුට හෝ භාර තැනැත්තාට, භාර දිය යුතු ය.

(2) (3) වන උපවගන්තියට යටත්ව, පරිගණකයේ අයිතිකරු හෝ භාර තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් මත, පොලිස් නිලධරයකු විසින් එකී අයිතිකරු හෝ තැනැත්තා විසින් නම් කරන ලද තැනැත්තකුට එසේ තහනමට ගනු ලැබ හෝ ප්‍රවේශය තහනම් කර ඇති පරිගණකයට ප්‍රවේශ වී එයින් අවශ්‍ය පරිගණක දත්තවල පිටපත් ලබාගැනීමට අවසර දීම හෝ එකී දත්තවල පිටපතක් ඒ තැනැත්තාට ලබාදීම කළ හැකි ය.

(3) කිසියම් අපරාධ විමර්ශනයකට හෝ නීති කෘත්‍යයකට හානිකර විය හැකි නම්, පොලිස් නිලධරයකු විසින් (2) වන උපවගන්තිය යටතේ වූ අවසරයක් ප්‍රදානය කිරීම හෝ එහි සඳහන් කරන ලද පරිදි වූ කිසියම් පිටපතක් ලබාදීම නොකළ යුතු ය.

23. (1) මේ පනත යටතේ වූ විමර්ශනයක දී කිසියම් හෙළිදරව්වක් කිරීමට හෝ සහායක් ලබාදීමට නියමකරන යම් තැනැත්තකු එකී අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(2) විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු වෙත පවරන ලද නීත්‍යානුකූල බලතල ක්‍රියාත්මක කිරීමට බාධා කරන හෝ විමර්ශන කාලය තුළ දී ඒ විශේෂඥයා හෝ පොලිස් නිලධරයා විසින් කරනු ලැබූ එවැනි ඉල්ලීමකට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

24. (1) මේ පනත යටතේ විමර්ශනයක යෙදෙන සෑම තැනැත්තකුම, ඒ විමර්ශන ක්‍රියාවලියේ දී තමාට දැනගන්නට ලැබෙන සියලු තොරතුරු අතිශයින්ම රහසිගතව පවත්වාගෙන යා යුතු අතර, එසේ ලබාගත් යම් තොරතුරු ඔහු විසින් මේ පනත යටතේ ඔහුගේ කාර්යයන් ඉටු කිරීමක් සඳහා හැර, යම් තැනැත්තකුට හෙළිදරව් කිරීම හෝ කුමනාකාරයේ හෝ යම් කාර්යයක් සඳහා භාවිත කිරීම හෝ නොකළ යුතු ය.

(2) කිසියම් තොරතුරක්, සපයන ලෙස ඉල්ලා ඇති හෝ ලබා දී ඇති සෑම සැපයුම්කරුවකු විසින් සහ යම්කිසි තොරතුරක් සුරක්ෂිත කිරීම සඳහා ලිඛිත දැන්වීමක් නිකුත් කර ඇති යම් තැනැත්තකු විසින් ඒ තොරතුරුවලට අදාළව සහ ඒ තොරතුරු ඉල්ලා සිටීම, ලබාගෙන තිබීම යන කාරණයට අදාළව, අතිශය රහස්‍යභාවයක් පවත්වාගෙන යා යුතු අතර නීත්‍යානුකූල අධිකාරී බලයක් ඇතිව මිස එකී කරුණු පිළිබඳ කිසිදු හෙළිදරව්වක් නොකළ යුතු ය.

(3) මේ පනත යටතේ යම් විමර්ශන කාර්යයක් සඳහා සේවා සැපයුම්කරුවකු විසින් යම් දත්ත හෝ වෙනත් තොරතුරක් හෙළිදරව් කිරීම හේතුවෙන් ඔහු සිවිල් හෝ අපරාධ නීතිය යටතේ ආදීන නොවිය යුතු ය.

(4) (1) වන හෝ (2) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**III වන කොටස**

**විවිධ**

25. මේ පනත යටතේ වූ සියලු වැරදි පිළිබඳ නඩු ඇසීම, විභාග කිරීම සහ තීන්දු කිරීම සම්බන්ධයෙන් වූ අධිකරණ බලය මහාධිකරණය වෙත මෙයින් පවරනු ලැබේ:

එසේ වුව ද, මේ පනත යටතේ වරදක් සිදු කිරීමට අදාළව 1977 අංක 8 දරන උදර්පන පනතේ විධිවිධාන අදාළ වන අවස්ථාවක දී එම වරද පිළිබඳ නඩු ඇසීම, විභාග කිරීම හා තීන්දු කිරීම පිළිබඳ අනන්‍ය බලය කොළඹ මහාධිකරණය වෙත පවරනු ලැබිය යුතු ය.

26. (1) අවස්ථාවෝචිත පරිදි, විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින් යථා පරිදි අත්සන් කොට නිකුත් කළ හා විශේෂඥයකු විසින් නියමිත ආකාරයෙන් වලංගු කරනු ලැබූ සෑම ලේඛනයක් ම, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු අතර ප්‍රතිවිරුද්ධතාවක් ඔප්පු කරන තෙක් එහි සඳහන් කරුණුවලට ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා —

"ලේඛනය" යන යෙදුමට, යම් සහතිකයක්, ප්‍රකාශනයක්, තොරතුරු, දත්ත, වාර්තා හෝ වෙනත් යම් එවැනි ලේඛනයක් ඇතුළත් වේ.

27. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ උපලේඛනයේ (ආ) කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් ඒ පනතේ ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(49) 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ කරන ලද වරදක්".

28. යම් විශේෂඥයකුට හෝ පොලිස් නිලධරයකුට එරෙහිව මේ පනත යටතේ ඔහුගේ කාර්යයන්ට අනුව ඒ විශේෂඥයා හෝ පොලිස් නිලධරයා විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ එසේ කළා යයි අදහස් කෙරෙන යම් නීත්‍යානුකූල කටයුත්තක් සඳහා කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

29. මේ පනත යටතේ තමන්ගේ කාර්යය ඉටු කරන සෑම විශේෂඥයකුම —

(අ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය අධිකාරියේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සාම නිලධරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ආ) දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන අධිකාරය) අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රාජ්‍ය නිලධරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

30. මේ පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදු කරන අවස්ථාවක දී, එවිට ඒ පුද්ගල මණ්ඩලය —

(අ) සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සියලු අධ්‍යක්ෂවරයන් සහ නිලධරයන් ; හෝ

(ආ) ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ සියලු හවුල්කරුවන් ; හෝ

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත නොකළ සමාගමක් නම්, එහි කළමනාකරණය සහ පාලනය සඳහා වගකිව යුතු ඒ සමාගමේ සියලු නිලධරයන්,

ඒ වරද සඳහා වරදකරු වශයෙන් සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද ඔහුගේ අනුදැනුමකින් තොරව සිදු කරනු ලැබූ බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි උද්යෝගයෙන් ක්‍රියාකරන ලද බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් එවැනි කිසිදු තැනැත්තකු ඒ වරද සඳහා වරදකරු වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

31. මේ පනත යටතේ සිදු කරනු ලැබූ වරදක් සම්බන්ධයෙන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා —

(අ) මේ පනත යටතේ, ශ්‍රී ලංකා දේශයෙන් පිටත දී සිදු කරනු ලැබූ යම් වරදක් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබූ වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) මේ පනතේ සඳහන් කරනු ලැබූ යම් තොරතුරු ස්පෘශ්‍ය දේපළක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

32. (1) මේ පනතේ නියමයන් සහ විධිවිධාන ඉටු කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ නියම කරනු ලැබිය යුතු යයි නියමිත කාරණා අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ නියෝගය යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

33. මේ පනතේ නිශ්චිතව දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ හෝ වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා ඉල්ලීමක් යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට හෝ ඔහු උදර්පනය කිරීමට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලැබීමට යෝජිත හෝ පියවර කවරේදැයි, යටකී ඉල්ලීම ඉදිරිපත් කරන රාජ්‍යයේ ආණ්ඩුව වෙත ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නොපමාව ම දැනුම් දිය යුතු ය.

34. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී —

(අ) ඔහු ජාතිකත්වය දරන රාජ්‍යයේ හෝ වෙනත් ආකාරයකින් ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හිමිකම ඇති රාජ්‍යයේ නිසි නියෝජිතයා සමග හෝ, ඔහු ආදේශික තැනැත්තකු නම්, ඔහු සිරිත් පරිදි වාසය කරන දේශයේ රාජ්‍යයේ ආසන්නතම නිසි නියෝජිතයා සමග හෝ අප්‍රමාදව සංදේශනය කිරීමට ;

(ආ) ඒ රාජ්‍යයේ නියෝජිතයකු විසින් ඔහු හමුවීමට පැමිණීමට ;

(ඇ) (අ) සහ (ආ) ඡේද යටතේ ඔහුගේ අයිතිවාසිකම් ගැන දැනුම් දීමක් ලැබීමට,

හිමිකම් ඇත්තේ ය.

35. (1) මේ පනතේ සඳහන් වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම හා නඩු පැවරීම සඳහා අවශ්‍ය කවර විටක දී වුව ද, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ විධිවිධාන, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුව සහ නියමයන් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන රටවල් හෝ ඉහතකී පනත ප්‍රකාර ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලයේ නොවන රටවල් අතර ආධාර සපයා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් නොවන රටක් සම්බන්ධයෙන් වන විට, සම්මුති රටකට යම්තාක් වූ සියලු ආධාර දීම (සාක්ෂි හා ප්‍රකාශ ලබා ගැනීම, සිතාසි භාරදීම හා සෝදිසි කිරීම ද ඇතුළුව) ඉටුකිරීම සඳහා අවශ්‍ය වන තාක් ප්‍රමාණයට අමාත්‍යවරයා මගින් සියලු ආධාර ඉල්ලා සිටීම ආණ්ඩුවේ කාර්යය විය යුතු ය.

(3) සම්මුති රටකට ආධාරදීම, සුදුසු යයි අමාත්‍යවරයා සිතන යම් නියම හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

36. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කුමක් සඳහන් වුව ද, ඒ පනතේ උපලේඛනයේ හා මේ පනතේ උපලේඛනයේ සඳහන් වරදක්, ඒ පනතේ කාර්යය සඳහා දේශපාලන ස්වභාවයේ වරදක් හෝ දේශපාලන වරදකට සම්බන්ධ වරදක් හෝ දේශපාලන හේතුවලින් පෙළඹ වූ වරදක් වශයෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුව හා යම් සම්මුති රටක් අතර යම් තැනැත්තකු උදර්පනය කිරීමේ කාර්යය සඳහා පමණක් හෝ 35 වන වගන්තිය යටතේ සම්මුති රටකට ආධාරදීම සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ එවැනි යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උදර්පනය කිරීමේ කාර්යය සඳහා වරදක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

37. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

38. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස —

"පරිගණකය" යන්නෙන්, තොරතුරු සැකසීමේ හැකියාව දරන ඉලෙක්ට්‍රොනික හෝ සමාන උපක්‍රමයක් අදහස් වේ ;

"පරිගණක දත්ත ආචයන මාධ්‍යය" යන්නෙන්, වෙනත් යම් අයිතමයක හෝ උපක්‍රමයක උපකාරයක් ඇතිව හෝ නැතිව තොරතුරු නැවත දැක්වීමේ සාමාර්ථ්‍යයක් දක්වන්නා වූ කිසියම් ඉලෙක්ට්‍රොනික අයිතමයක් හෝ උපක්‍රමයක් අදහස් වේ;

"පරිගණක වැඩ සටහන්" යන්නෙන්, පරිගණකයකට කියවිය හැකි මාධ්‍යයකින් සංස්ථාගත කිරීමට හැකි කරවන්නා වූ, පරිගණකයට විශේෂිත කාර්යයක් ඉටු කිරීමට හෝ එයට ළඟාවීමට සලස්වන වචනවලින්, කේතවලින්, යෙදුම්වලින් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රකාශිත උපදේශන මාලාවක් අදහස් වේ ;

"පරිගණක පද්ධතිය" යන්නෙන්, පරිගණකයක් හෝ අන්තර්ජාලය ඇතුළුව අන්තර් සම්බන්ධිත පරිගණක සමූහයක් අදහස් වේ ;

"ලේඛනයක්" යන්නට, කිසියම් ඉලෙක්ට්‍රොනික ලේඛනයක් ඇතුළත් වේ ;

"ඉලෙක්ට්‍රොනික ලේඛන" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ක්‍රමයකින් හෝ ක්ෂුද්‍රපටල (මයික්‍රෝෆිල්ම්) හෝ ඒ සමාන වෙනත් යම් ආකාරයේ ක්‍රමයකින් උත්පාදනය කරන ලද, ආචය කරන ලද, ලබාගත් හෝ යවන ලද තොරතුරු, වාර්තා හෝ දත්ත අදහස් වේ ;

"කර්තව්‍ය" යන්නෙන්, පරිගණකයකට අදාළව, පරිගණකයකින් හෝ ඒ තුළින් තර්කනය, අංක ගණිතමය වැඩ සටහනක් පාලනය කිරීම හෝ පවත්වාගෙන යාම, මකා දැමීම, ගබඩා කිරීම, ආචනය නැවත ලබා ගැනීම සහ සන්නිවේදනය ඇතුළත් වේ;

"තොරතුරු" යන්නෙන්, දත්ත, පාඨ, අනුරූප, ශබ්ද, කේත, පරිගණක වැඩ සටහන්, දත්ත සමුදායයන් හෝ මයික්‍රෝෆිල්ම් ඇතුළත් වේ ;

"සේවා සැපයුම්කරු" යන්නෙන් —

(අ) පරිගණක පද්ධතියක් මාර්ගයෙන් සංනිවේදනය කිරීමට එය භාවිත කරන්නන්ට හැකිවන පරිදි සේවාවක් සපයන හෝ පහසුකම් සලසන පොදු හෝ පුද්ගලික මූලිකයකු ; සහ

(ආ) එවැනි මූලිකයකු හෝ එවැනි භාවිත කරන්නන් උදෙසා පරිගණක දත්ත හෝ තොරතුරු සකස් කරන හෝ ආචනය කරන වෙනත් යම් මූලිකයකු අදහස් වේ ;

"සේවාදායක තොරතුරු" යන්නෙන්, සේවා සැපයුම්කරුවකු විසින් පරිගණක දත්ත ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් පවත්වාගෙන යන එහි සේවාදායකයන්ට අදාළ කිසියම් තොරතුරක් අදහස් වේ ;

"හුවමාරුවන දත්ත" යන්නෙන් —

(අ) පරිගණක පද්ධතියක් මාර්ගයෙන් සන්නිවේදනය ස්වභාවයකට අදාළ ;

(ආ) සේවා සපයන්නකුගේ කොටසක් ලෙස පරිගණක පද්ධතියක් මගින් උත්පාදනය කරන ලද ; සහ

(ඇ) සන්නිවේදන ප්‍රභවය, ගමනාන්තය, මාර්ගය, කාලය, දත්ත, ප්‍රමාණය, කාලසීමාව හෝ සේවාදායක තොරතුරු පෙන්නුම් කරන,

දත්ත අදහස් වේ.

## 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 18 වන දින]

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ ( සංශෝධන ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 12 වන වගන්තියේ (3) උපවගන්තියෙහි, "සහ 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය", යන වචන වෙනුවට "1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ .

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (1) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1අ) ප්‍රතිරක්ෂණය කිරීම කරනු ලබන සෑම රක්ෂණකරුවකු විසින් ම ප්‍රතිරක්ෂණය කිරීමට අපේක්ෂා කරනු ලබන වගකීමෙන්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සියයට පනහකට වැඩි නොවන ප්‍රතිශතයක්, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත, එම රක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 18 වන දින]

**2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 6 වන වගන්තියේ (1) උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (2) උපවගන්තියේ "සාමාජිකයන් තුන්දෙනකු", යන වචන වෙනුවට "සාමාජිකයන් පස්දෙනකු" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇඇ) රක්ෂණ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් සිදු කරන ලද හෝ නිකුත් කරන ලද යම් රක්ෂණ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවකින් පැන නගින යම් වගකීමක් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණය භාරගත යුතු ය;

(ඇඇඇ) මණ්ඩලය විසින් සිදුකරන ලද හෝ නිකුත් කරන ලද යම් රක්ෂණ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවකින් පැන නගින යම් වගකීමක්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටින යම් රක්ෂණකරුවකු වෙත ප්‍රතිරක්ෂණය කරනු ලැබිය හැකි ය.;".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2007 අංක 33 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අගෝස්තු මස 21 වන දින]

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2007 අංක 33 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතෙහි 34අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

34අ (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද—

"ඇතැම් ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතන වලට ණය සාධන පත්‍ර නිකුත් කිරීම මගින් මුදල් ණයට ලබා ගත හැකි බව.

(අ) තත්කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා විසින් කලින් කල නිකුත් කරන ලද දැන්වීමක් මගින් නිශ්චය කරනු ලබන මුදලකට වඩා අඩු නොවන ක්ෂය නොවූ ගෙවා නිම කළ සහ නිකුත් කරනු ලැබ ඇත්තාවූ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලබන්නා වූ සහ මේ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පොදු සමාගමක් වන්නා වූ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයකට, යම් ණය සාධන පත්‍ර නිකුත් කිරීම මගින්; හෝ

(ආ) (අ) වන ඡේදය යටතේ නිකුත් කරන ලද නිවේදනයේ නිශ්චිතව සඳහන් වූ මුදලට වඩා අඩු, ක්ෂය නොවූ ගෙවා නිම කළ සහ නිකුත් කරනු ලැබ ඇත්තාවූ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලබන්නා වූ සහ මේ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පොදු සමාගමක් වන්නා වූ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයකට, පෞද්ගලික පැවරීම් මගින්,

අධ්‍යක්ෂවරයාගේ අනුමතය ඇතිව, මුදල් ණයට ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

(2) තත්කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මගින් එම ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනය විසින් (1) වන උපවගන්තියේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයාගේ අනුමතය ලබාගත යුතු අතර, එම අනුමතය අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්විය හැකිය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා—

"ණය සාධන පත්‍රය" යන්නෙන්, සෑණ පත්‍රයක්, බැඳුම්කරයක්, පොරොන්දු නෝට්ටුවක් හෝ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ණය සාධන පත්‍රයක් අදහස් වේ; සහ

"පෞද්ගලික පැවරීම" යන්නෙන්, සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමකින් හෝ අන්තර්ජාලය, තැපැල, පැක්ස්, විද්‍යුත් තැපැල, පත්‍රිකා, බැනර්, පෝස්ටර් හෝ කුඩා පොත් හෝ කවර හෝ අයුරකින් සිදුකරනු ලබන යම් ආකාරයක ප්‍රචාරක වැඩ ඇතුළු ජනමාධ්‍ය හරහා කරනු ලබන ප්‍රකාශ කිරීමකින් හෝ තොරව, සෑණ සාධන පත්‍ර නිකුත් කිරීම අදහස් වේ.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.